(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 10.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2025 ජනවාරි 09 බ්‍රහස්පතින්දා පූ.භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

87/2024

ගරු කිංස් නෙල්සන් මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජය සතු ගුවන්විදුලි ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) එම එක් එක් ආයතනයේ සේවය කරනු ලබන සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) 2015 වර්ෂයේ සිට මේ දක්වා එම එක් එක් ආයතනය ලැබූ ලාභ/අලාභ එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඉහත සඳහන් ආයතන අලාභ නොලබන තත්ත්වයෙන් පවත්වාගෙන යාම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

101/2024

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2024.11.20 දින වනවිට ගෘහස්ථ සහ ව්‍යාපාරික යන එක් එක් පදනම යටතේ විදුලි ඒකකයක් සඳහා අය කරනු ලබන ගාස්තුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2024.10.21 දින සිට මේ දක්වා සිදු කර ඇති විදුලි ගාස්තු සංශෝධනවල විස්තර කවරේද;

(iii) එම සංශෝධන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ තීරණවලට/ අනුමතියට යටත්ව සිදු කර තිබේද;

(iv) ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව ලබා දෙන තීරණ පිළිගන්නේද;

(v) එම කොමිෂන් සභාව විසුරුවා හැරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) විදුලිය සඳහා ස්ථාවර මිලක් පවත්වාගෙන යාමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම ස්ථාවර මිල කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

109/2024

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට ක්‍රියාත්මක වන පෞද්ගලික විදුලි බලාගාර සංඛ්‍යාව කොපමණද;

(ii) එම විදුලි බලාගාරවල නම් කවරේද;

(iii) එම එක් එක් බලාගාරයේ හිමිකරුගේ නම හා ලිපිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) 2015 වර්ෂයේ සිට මේ දක්වා එම බලාගාර හිමිකරුවන්ට ගෙවා ඇති මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් විදුලි බලාගාර හිමිකරුවන් සමඟ එළැඹ ඇති ගිවිසුම් ඉතා අහිතකර බව දන්නේද;

(ii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

133/2024

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා,— අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතිය තුළ විභාග කරමින් පවතින අවුරුදු පහ ඉක්ම වූ සිවිල් නඩු සංඛ්‍යාව සහ අවුරුදු දහය ඉක්මවූ සිවිල් නඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) නඩු විභාග කර අවසන් කිරීමේදී පවතින ප්‍රමාදය වැළැක්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

174/2024

ගරු රවී කරුණානායක මහතා,— කම්කරු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය වසර 5 තුළ ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ ශ්‍රම බලකාය වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) පසුගිය වසර 10 තුළ ස්ථිර සහ අනියම් රාජ්‍ය සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) පසුගිය වසර 10ක කාලය තුළ රාජ්‍ය සේවකයන්ගේ වැටුප් හා දීමනා සඳහා වූ මුළු මූල්‍ය පිරිවැය කවරේද;

(iv) පසුගිය වසර 10 තුළ ගෙවා ඇති මුළු විශ්‍රාම වැටුප් ප්‍රමාණය කොපමණද;

යන්න එක් එක් වර්ෂය අනුව එතුමා මෙම සභාවට දන්වන්නෙහිද;

(ආ) (i) ඉදිරි වසර 10 සඳහා පුරෝකථනය කළ හැකි ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ ශ්‍රම බලකාය වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඉදිරි වසර 5 සඳහා බඳවා ගැනීමට අදහස් කරන රාජ්‍ය සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉදිරි වසර 10 සඳහා අපේක්ෂිත විශ්‍රාම වැටුප් වියදම් කවරේද;

(iv) ඉදිරි වසර 10 සඳහා අපේක්ෂිත විශ්‍රාමිකයන් සංඛ්‍යාව කවරේද;

යන්නත් එක් එක් වර්ෂය අනුව එතුමා මෙම සභාවට දන්වන්නෙහිද;

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

6.

182/2024

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2019 වර්ෂයේ සිට මේ දක්වා ජාතික විදුලිබල පද්ධතියට අලුතින් එකතු කරන ලද විදුලි බලාගාර සංඛ්‍යාව සහ ඒවායේ නම් කවරේද;

(ii) එම එක් එක් විදුලි බලාගාරයෙන් ජනනය කිරීමට අපේක්ෂා කරන ලද විදුලි ධාරිතාවය සහ මේ වනවිට ජනනය කරනු ලබන විදුලි ධාරිතාවය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත විදුලි බලාගාර අතරින් පුනර්ජනනීය බලාගාර සංඛ්‍යාව කොපමණද;

(iv) එම බලාගාර කවරේද;

(v) එම එක් එක් විදුලි බලාගාරයෙන් ජනනය කරනු ලබන විදුලි ධාරිතාවය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉදිරි වසර දෙක තුළදී ජාතික විදුලි පද්ධතිය වර්ධනය කිරීම සඳහා ඇති සැලසුම් කවරේද;

(ii) පුනර්ජනනීය බලශක්තිය වර්ධනය කිරීම සඳහා වන සැලසුම් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

237/2024

ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය,— විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොරියාවේ රැකියා සඳහා පිටත්ව යන ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සඳහා ලබා දෙන වීසා වර්ග කවරේද;

(ii) E8 වීසා යටතේ ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් කොරියානු රජයේ රැකියා සඳහා පිටත් කර යැවීමට පසුගිය රජය විසින් ගනු ලැබූ තීරණයේ පදනම කවරේද;

(iii) ඒ යටතේ කොරියානු රැකියා සඳහා පිටත්ව ගොස් ඇති ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම ශ්‍රමිකයින් විපතට පත් වී ඇති බව දන්නේද;

(v) එසේ නම්, විපතට පත් වූ සංඛ්‍යාව කොපමණද;

(vi) ඔවුන් සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කොරියානු රැකියා සඳහා ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් පිටත් කරනු ලබන්නේ E8 වීසා යටතේ පමණක්ද;

(ii) වෙනත් වීසා වර්ග තිබේ නම්, ඒවා කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

239/2024

ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ පැවති ආර්ථික අර්බුදය හේතුවෙන් විශේෂඥ වෛද්‍යවරුන්, වෛද්‍යවරුන් සහ වෙනත් පුහුණු සෞඛ්‍ය වෘත්තිකයන් රට හැර ගිය බවත්;

(ii) එමගින් ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සේවයට අහිතකර බලපෑමක් සිදු වන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සේවයේ සේවය කරනු ලබන;

(ii) ඉදිරියේදී රජයේ සෞඛ්‍ය සේවයෙන් විධිමත් සේවාවක් සැපයීම සඳහා සිටිය යුතු;

(iii) වර්ෂ 2022 සිට 2024 නොවැම්බර් මස දක්වා, විශ්‍රාම ගැන්විය යුතු වයස සම්පූර්ණ නොවී සේවයෙන් ඉවත් වූ;

(iv) විශේෂඥ පුහුණුව ඇතුළු විවිධ අධ්‍යයන ආයතනවල මේ වනවිට පුහුණු වෙමින් සිටින;

විශේෂඥ වෛද්‍යවරුන්, වෛද්‍යවරුන්, හෙද නිලධාරින්, පරිපූරක හා අතුරු වෛද්‍ය සේවා නිලධාරින් සහ කණිෂ්ඨ සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඔවුන් කඩිනමින් සෞඛ්‍ය සේවයට බඳවා ගැනීම සඳහා ගනු ලබන පියවර කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

247/2024

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 'COVID-19 වැළඳී ඇතැයි සැක කෙරෙන රෝගීන් සහ තහවුරු කරන ලද රෝගීන් පිළිබඳව වන සායනික පුහුණු මාර්ගෝපදේශකය' නමැති ප්‍රකාශනය පිළිබඳව දන්නේද;

(ii) එසේ නම්, එම ප්‍රකාශනයට අන්තර්ගතය සහ නිර්දේශ මඟින් දායක වූ විශේෂඥයින්ගේ නම් කවරේද;

(iii) ඔවුන් විශේෂඥ සම්පත්දායකයින් ලෙස සේවය කරන අවස්ථාවේදී ඔවුන් අනුබද්ධිතව සිටි ආයතන සහ ඔවුන්ගේ තනතුරු නාම කවරේද;

(iv) ඔවුන් පත් කිරීම සඳහා වගකීම දැරූ බලධාරියා කවුරුන්ද;

(v) ඔවුන් තෝරා ගැනීම සඳහා අනුගමනය කරන ලද නිර්ණායක/පදනම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත ප්‍රකාශනයේ 7 වන ඡේදය පිළිබඳව දන්නේද;

(ii) එසේ නම්, එම ඡේදයේ අන්තර්ගතය සහ නිර්දේශ සඳහා වගකිව යුතු නිශ්චිත විශේෂඥ සම්පත්දායකයින්ගේ නම් කවරේද;

(iii) 7 වන ඡේදයේ අන්තර්ගතය සහ නිර්දේශ සකස් කිරීම සඳහා භාවිතා කරන ක්‍රියාවලිය, ලේඛන සහ ආශ්‍රේය ග්‍රන්ථ වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) 7 වන ඡේදයේ නිර්දේශ දේශීය හෝ ජාත්‍යන්තර වශයෙන් වෛද්‍ය ආචාර ධර්ම සහ වෛද්‍ය මානව විද්‍යාව යන ක්ෂේත්‍රවල විශේෂඥයින්ගේ වෘත්තීය මතයට භාජනය වී තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේ දී

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම

1.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— විසර්ජන,— 2025 මුදල් වර්ෂයේ සේවා වියදම් සඳහා විධිවිධාන සැලසීම සඳහා ද; ඒ සේවා කාර්යය සඳහා ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් බැහැර හෝ ණය ලබා ගැනීමට බලය දීම සඳහා ද; ඒ මුදල් වර්ෂය තුළ ආණ්ඩුවේ ඇතැම් කටයුතු වෙනුවෙන් මූලා ප්‍රතිපාදන සැකසීම සඳහා ද; එම කටයුතු වෙනුවෙන් ඒ මුදල් වර්ෂය තුළ වියදම් සඳහා අවශ්‍ය වන මුදල් ඒකාබද්ධ අරමුදලින් හෝ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළ හැකි වෙනත් යම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ අත්තිකාරම් වශයෙන් ගෙවීමට ඉඩ සැලසීම සඳහා ද; ඒකාබද්ධ අරමුදලට ඒ මුදල් ආපසු ගෙවීමට විධිවිධාන සැලසීම සහ ඉහත කී කාරණා හා සම්බන්ධ හෝ එයට ආනුෂංගික කාරණා සම්බන්ධයෙන් විධිවිධාන සැලසීම සඳහා ද වූ පනත් කෙටුම්පතකි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

2.

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා,— පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන),— ඡන්ද විමසීම් කැඳවනු ලැබ සහ කල් තබා ඇත්තා වූ ඇතැම් පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් අලුතින් නාමයෝජනා කැඳවීම සඳහා සහ එම පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් ඡන්ද විමසීම් පැවැත්වීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ ද, ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ ද පනත් කෙටුම්පතකි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**යෝජනා පිළිබඳ දැනුම්දීම**

3.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 5.30 දක්වා ද විය යුතු ය. පූ.භා. 11.30ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 5.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*1.

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියමය,— 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 වගන්තිය යටතේ සෙස් බද්ද සම්බන්ධයෙන් එවකට ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2024 සැප්තැම්බර් 05 දිනැති අංක 2400/25 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.01.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 1),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් එවකට මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2024 මැයි 17 දිනැති අංක 2384/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.01.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 2),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 සහ 5 වගන්ති යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් එවකට මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2024 ජූලි 31 දිනැති අංක 2395/32 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.01.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 3),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන, සැලසුම් සහ සංචාරක අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2024 ඔක්තෝබර් 02 දිනැති අංක 2404/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.01.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 4),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 සහ 5 වගන්ති යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන, සැලසුම් සහ සංචාරක අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2024 ඔක්තෝබර් 14 දිනැති අංක 2406/02 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.01.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 5),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන, සැලසුම් සහ සංචාරක අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2024 නොවැම්බර් 01 දිනැති අංක 2408/15 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.01.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 6),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2024 නොවැම්බර් 30 දිනැති අංක 2412/38 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.01.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— සුබසාධක ප්‍රතිලාභ පනත යටතේ අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ යෝජනා ක්‍රමය,— 2002 අංක 24 දරන සුබසාධක ප්‍රතිලාභ පනතේ 9 වගන්තිය යටතේ සුබසාධක ප්‍රතිලාභ සම්බන්ධයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2024 දෙසැම්බර් 21 දිනැති අංක 2415/66 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.01.07 දින ඉදිරිපත් කරන ලද අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ යෝජනා ක්‍රමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නිවේදනය,— සංශෝධිත 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3(4) වගන්තිය යටතේ ජේ ජේ ටෙක්ස්ටයිල්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් එවකට ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව 2024 අගෝස්තු 26 දිනැති අංක 2399/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.12.03 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමය,— සංශෝධිත 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3(4) වගන්තිය යටතේ කලම්බු වෙස්ට් ඉන්ටර්නැෂනල් ටර්මිනල් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් එවකට ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව 2024 සැප්තැම්බර් 10 දිනැති අංක 2401/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.12.17 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ එවකට මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2024 මැයි 17 දිනැති අංක 2384/35 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.01.07 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බදු පනත යටතේ නියෝගය,— 2011 අංක 18 දරන වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බදු පනතේ 3(3) වගන්තිය යටතේ වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බද්ද සම්බන්ධයෙන් එවකට මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2024 මාර්තු 28 දිනැති අංක 2377/39 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.01.07 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*13.

ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා,— පරිපූරක මුදල,— ශීර්ෂය 117 — වැඩසටහන 02 — † 2024 ජනවාරි 1 දිනෙන් ආරම්භ වන හා 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මුදල් වර්ෂයේ ප්‍රයෝජනය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලෙන් හෝ රජයට අයත් අනිකුත් ඕනෑම අරමුදලකින් හෝ මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අභිමතය පරිදි රජය විසින් ලබාගන්නා ලද ඕනෑම ණය මුදලකින් රුපියල් මිලියන තිස්තුන් දහස් අටසිය දහහතකට (රු. 33,817,000,000) නොඉක්මවන අතිරේක මුදලක් ගෙවිය යුතු බවටත් එකී මුදල මෙහි ඇති උපලේඛනයේ දක්වා ඇති පරිදි වියදම් කළ යුතු බවටත්, මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

**උපලේඛනය**

| | | | | |
|---|---|---|---|---|
| **ශීර්ෂය** | **117** | - | ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය<br>(2023 අංක 34 දරන විසර්ජන පනතේ සඳහන් අමාත්‍යාංශ නාමය දක්වා ඇත) | |
| **වැඩසටහන** | **02** | - | සංවර්ධන වැඩසටහන | |
| | | | මූලධන වියදම් | රු. 33,817,000,000 |
| | | | **මුළු වියදම** | **රු. 33,817,000,000** |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

† 2024 දෙසැම්බර් 06 දින ඉදිරිපත් කරන ලද 2024 අංක 15 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න.

පරිපූරක ඇස්තමේන්තු අංක 1 සිට 14 දක්වා එකතුව රු. 234,623,000,000

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***